කොවිඩ්-19 වාර්තාකරණය සම්බන්ධයෙන් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය මගින් නිකුත් කොට ඇති නිර්දේශයන්හි , 'වෛරසය ආසාදිත පුද්ගලයින් "රෝගීන්" මිස අනෙක් අයට "රෝගය පතුරුවන්නන්" ලෙසින් හැඳින්වීමෙන් වලකින' ලෙසින් සඳහන් වේ. මෙවැනි මාධ්‍ය නිර්දේශයන්ට අනුකූලව කොවිඩ්-19 වාර්තාකරණයේ අවශ්‍යතාවය වන්නේ, එවැනි හැඳින්වීම් ඔස්සේ කොවිඩ්-19 ආසාදිතයන් සම්බන්ධයෙන් සමාජය තුළ කොන් කිරීමේ ආකල්පයක් ඇතිවීමට ඇති හැකියාව අවම කිරීම සහ ඒ ඔස්සේ රෝගීන් නිසි වෛද්‍ය උපදෙස් හා ප්‍රතිකාර නොගෙන සැඟවීමට ඇති ඉඩ අවම කිරීම උදෙසායි.

කෙසේ නමුත්, මාධ්‍ය සඳහා වන මෙම නිර්දේශයන් හඳුන්වා දීමෙන් පසුව වුවත්, ඇතැම් මාධ්‍ය දිගින් දිගටම ආචාර ධාර්මික නොවනාකාරයෙන් කොවිඩ්-19 සම්බන්ධ පුවත් වාර්තා කරනු දක්නට ලැබීම සැබවින්ම කණගාටුවකි.

උදාහරණ ලෙස, අරුණ පුවත්පතේ (11/02) පළවූ පහත පුවත් සිරස්තල පෙන්විය හැක. යම් පුද්ගලයෙකුට කොවිඩ්-19 වැළඳීම එම පුද්ගලයාගේ වරදක් නොවේ. එසේ නම්, කොවිඩ්-19 පිළිබඳ වාර්තාකරණයේදී මාධ්‍ය මඟින් කොවිඩ්-19 ආසාදිතයන් වරදකාරීත්වයකින් හැඳින්වෙන ආකාරයෙන්, ඒ ඔස්සේ ඔවුන් සමාජයේ කොන් කිරීමකට ලක් වන ආකාරයෙන් පුවත් ඉදිරිපත් කිරීම කෙතරම් වගකීම් විරහිත වන්නේද? එය මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනය කිරීමක් නොවන්නේද?

මූලාශ්‍ර: https://mcusercontent.com/e5e1192127653987d107e6f98/images/6a771830-d3bd-456e-8fbf-8e11372e9adc.png?fbclid=IwAR1VlkgqrYrMzx93qOlIPK1re-gc4-b_HFA1Wo00w1L9PhF3mcvOFJ5U3aU
#COVID19 #Media #MoH_SriLanka #MediaEthicsSL #lka #NewsPapers #Aruna